සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

පාඩම/ඒකකය - 1.1.5 ජනාකීර්ණ වීථියක් චිත්‍රයට නගමු

## ජනාකීර්ණ වීථියක සුන්දරත්වය සිතුවමට නගමු.

1. ඉගෙනුම් ආධාරක

- ජනාකීර්ණ වීථි දැක්වෙන චිත්‍ර, ඡායාරූප





2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- දී ඇති ජනාකීර්ණ නගරයක සිතුවම් හොඳින් නිරීක්ෂණය කරන්න.
  - මිනිස්සුන්ගෙ විවිධ ක්‍රියාකාරකම්
  - ගොඩනැගිලි, යාන වාහනවල විවිධ වෙනස්කම්
  - තැන තැන දක්නට ලැබෙන ස්වභාවික වෘක්ෂලතා

3. ප්‍රකාශන චිත්‍රයක් ඇඳීමේ දී සැලකිය යුතු පොදු උපදෙස් අධ්‍යයනය කරන්න.

- මාතෘකාවට අදාලව ඇඳිය යුතු ය
- තලය භාවිතය - ජීවී අජීවී වස්තූන් කඩදාසියේ සමබරතාවය රැකෙන පරිදි යෙදිය යුතු ය
- පර්යාලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර වස්තූන් කුඩාවටත් පෙන්විය යුතු ය
- වර්ණ ගැන්වීමේ දී ත්‍රිමාණ ලක්ෂණ මතුවන සේ එළිය සහ අඳුර දැක්විය යුතු ය
- එමෙන්ම වර්ණ ගැන්වීමේ දී ද වර්ණ මිශ්‍ර කරමින් මාතෘකාවට ගැලපෙන ලෙසින්, ළඟ පෙනෙන වර්ණ දීප්තිමත්ව හා දුරට යන විට ලා පැහැයෙන් (වර්ණ පර්යාලෝකය) පෙන්වමින් වර්ණ කළ යුතු ය

## 4. ඇගයීම

1. දී ඇති ආදර්ශ චිත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න. එමෙන්ම ඔබ දැක ඇති නගරයක් පිළිබඳව ද මනසින් සිහිපත් කරන්න.

2. දැන් ඔබ මනසින් දකින චිත්‍රය සිතුවමට නැගීම සඳහා දළ සටහනක් ඇඳගන්න.

3. දළ සටහනේ අඩුපාඩු ද නිවැරදි කරගනිමින් චිත්‍ර අඳින පොතේ ඇඳ වර්ණ කරන්න.

4. වර්ණ පර්යාලෝකය හා ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීම ගැන සැලකිලිමත් වන්න.

5. පැය දෙකක කාලයක් තුළ චිත්‍රය නිමා කරන්න.